## සංක්ෂිප්තය

පසුගිය වසර පහ තුළ නැවුම් හෝ ශීත කළ එළවළු වශයෙන් වසරක දී අපනයනය කළ මෙ.ටො. 17332කට ආසන්න එළවළු ප්‍රමාණය එකී කාලසීමාව තුළ රට තුළ නිපදවූ එළවළු ප්‍රමාණයෙන් 2%ක් පමණ වේ. නමුත් දේශීය එළවළු නිෂ්පාදන අංශය වර්තමානයේ දී මුහුණ දී ඇති බොහෝ අභියෝග ජය ගැනීම සඳහා පවතින එක් විකල්පයක් වශයෙන් අපනයනය සඳහා එළවළු වගා කිරීම ප්‍රවර්ධනය කිරීමේ වටිනාකම අවතක්සේරු කළ නොහැක.

නුවරඑළිය, බදුල්ල හා මාතලේ දිස්ත්‍රික්ක ඇසුරෙන් මෙම අධ්‍යයනය සිදු කරන ලදී. දේශගුණික විචලතා, නව හා වැඩි දියුණු කළ තාක්ෂණික ක්‍රම පිළිබඳ අනවබෝධය, බීජ හිඟය හා බීජවල අඩු ගුණාත්මය, අධික යෙදවුම් මිල, උපදේශක සේවා ප්‍රමාණවත් නොවීම, එළවළු බෝගවල විභව අස්වනු නෙළා ගැනීමට සෘජු හෝ වක්‍ර ලෙස බාධා පමුණුවන සාධකයන් වේ. කාලගුණික විචලතාවලට අනුගත වෙමින් සැලසුම් රහිත නිෂ්පාදන රටාවක් අනුගමනය කිරීමේ ප්‍රතිඵලය වන්නේ එළවළු සැපයුමේ කාලීන විචලතාවන්ය. එහි එක් අවසාන අහිතකර ප්‍රතිඵලය වන්නේ එළවළු මිල උච්චාවචනයවීම තුළින් එළවළු නිෂ්පාදකයාගේ ආදායම අවිනිශ්චිත වීමය. එය එළවළු ගොවීන්ගේ ජීවන මට්ටම නඟා සිටුවීම සඳහා පවතින බරපතල අභියෝගයක් වී ඇත. එනමුත් ගොවීන් සාම්ප්‍රදායික ලෙස එළවළු ගොවිතැනේ නියැළෙන්නේ එය ඔවුන්ගේ ජීවනෝපාය වන බැවිනි.

මෙම අධ්‍යයනයෙන් අනාවරණය වූ පරිදි ආරක්ෂිත ගෘහ තුළ මෙන්ම විවෘත වගා භූමිවල වගා කරන එළවළු ද අපනයනය සඳහා භාවිතා කරයි. මාලදිවයින වැනි සංචාරක කර්මාන්තය දියුණු මට්ටමින් ක්‍රියාත්මක වන රටවල් වෙතින් හරිතාගාර එළවළු සඳහාත්, මැදපෙරදිග ජීවත් වන ශ්‍රී ලාංකිකයන් ඇතුළු ආසියාතිකයන් වෙතින් විවෘත භූමිවල වගා කරන උඩරට හා පහතරට එළවළු සඳහාත් වශයෙන් එළවළු ඉල්ලුම නිර්මාණය වී ඇත.

බදුල්ල දිස්ත්‍රික්කයෙන් හමුවන බහුතරයක් ගොවීහු අපනයනය ඉලක්ක කරගත් නිෂ්පාදන රටාවක් අනුගමනය කරනු ලබන අතර ඔවුන්ගේ නිෂ්පාදනයේ වැඩි කොටස අපනයනය සඳහා සපයති. නුවරඑළිය දිස්ත්‍රික්කය තුළ හරිතාගාර එළවළු මෙන්ම විවෘත ක්ෂේත්‍රවල වගා කරන එළවළු අපනයනය සඳහා සපයයි. මාතලේ දිස්ත්‍රික්කයේ ගොවීහු විවෘත භූමිවල වගා කරන පහත රට එළවළු වර්ග බහුල වශයෙන් අපනයනය සඳහා සපයති. මෙම ගොවීන් සිය නිෂ්පාදනවලින් අපනයනය සඳහා සපයනු ලබන්නේ 22%ක් පමණ ප්‍රමාණයකි. එම ගොවීන් එළවළු ගොවිතැනේ නිරතවීමේ මුඛ්‍ය පරමාර්ථය දේශීය වෙළඳපළ වෙත එළවළු සැපයීමයි. සමස්ත නියැදිය තුළ බහුතර ගොවීන් ආරක්ෂිත ගෘහ නොමැති (63%), දේශීය වෙළඳපළ ඉලක්ක කර ගනිමින් එළවළු වගා කරන (77%) ගොවීන්ය. අධ්‍යයනයෙන් තහවුරු වන පරිදි සැපයුම්කරුවන්ගේ ව්‍යාපාරවල ප්‍රගතිය/පසුබෑම ඔවුන් ක්‍රියාත්මක වන ප්‍රදේශය, පළපුරුද්ද, අධ්‍යාපන මට්ටම, වයස හෝ ආයෝජනවල විශාලත්වය යනාදී සමාජ-ආර්ථික සාධක මත වෙසෙසියාත්මක සබඳතා පෙන්නුම් නොකරයි. එබැවින් සැපයුම්කරුවන්ගේ ව්‍යාරවල ප්‍රගතිය හෝ පසුබෑම ඔවුන්ගේ පාලනයෙන් බැහැර වූ සාධක මත තීරණය වී ඇති බව අධ්‍යයනයෙන් තහවුරු වේ.

පොදුවේ ගත් කල එළවළු සැපයුම්කරුවෝ දුෂ්කරතා ගණනාවක් මධ්‍යයේ සිය ව්‍යාපාර පවත්වා ගෙන යති. ඇණවුම් නිසි කලට එළවළු සපයා ගත නොහැකිවීම, ඇණවුම සම්පූර්ණ කිරීමේ

කාලසීමාව අඩුවීම, සිය ගොවි ජාලයන් සතුව අවශ්‍ය එළවළු නොතිබීමෙන් නිත්‍ය නොවන නිෂ්පාදකයන්ගෙන් වැඩි මිලට හා වැඩි ප්‍රවාහන වියදමක් දරා එළවළු ලබා ගැනීමට සිදුවීම එම ගැටලු අතර වේ. අපනයන වෙළඳපළ තුළ ඉල්ලුම සීමාවීම, ගුවන් ගමන් අවලංගු වීම හා අපනයනකරු වෙනස් මාර්ග ඔස්සේ අඩු මිලට එළවළු සපයා ගැනීම යන අවස්ථාවල දී සැපයුම්කරුට ලැබෙන ඇණවුම් සීමා වේ. සමහරවිට මුළුමණින්ම අවලංගු වේ. ගොවීන් සැපයුම්කරුවන් හා අපනයනකරුවන් අතර පවතින දියාරු සබඳතා හේතුවෙන් එළවළු අපනයන කර්මාන්තය සංවිධිත කර්මාන්තයක් ලෙස හැඳින්විය නොහැක. තවද, ආර්ථික මධ්‍යස්ථානවල ව්‍යාපාරිකයන්ගේ මැදිහත්වීම අපනයනකරුවන්ට එළවළු සපයා ගැනීම ආශ්‍රිත ගුණාත්මක හා ප්‍රමාණාත්මක අවිනිශ්චිතතා අවම කර ගැනීමට උපකාරි වී ඇත. එළවළු තේරීම, ගොවි සබඳතා පලුදුවීම සැපයුම්කරු මුහුණපාන දෙවන ගැටලුව වේ. පුහුණු ශ්‍රමිකයන්ගේ හිඟය, ගබඩා හා ශීතාගාර සහිත ප්‍රවාහන පහසුකම් නොමැතිවීම/ප්‍රමාණවත් නොවීම, ණය ලබා ගැනීමේ ගැටලු ද එම දුෂ්කරතා අතර වේ.

අධ්‍යයන සොයා ගැනීම්වලට අනුව එළවළු අපනයන ක්ෂේත්‍රය තුළ උද්ගතවී ඇති ගුණාත්මක, ප්‍රමාණාත්මක හා කාලීන සැපයුම ආශ්‍රිත ගැටලුවල මූලාරම්භය අපනයන එළවළු සඳහා පවතින ඇණවුම් පිළිබඳ අවිනිශ්චිතතාව වේ. අපනයන වෙළඳපොළ වඩා පුළුල් වීම/කිරීම සඳහා එළවළු අපනයනය ඉහළ නැංවීම අත්‍යවශ්‍ය වේ. එබැවින් අපනයන කර්මාන්තය විධිමත් කිරීම සඳහා රාජ්‍ය මැදිහත්වීමකින් අපනයන වෙළඳපොළ පුළුල් කිරීම සඳහා ක්‍රමවත් ක්‍රමවේදයක් සකස් කර වර්තමානයේ අප රටට ලැබෙන ඇණවුම් ප්‍රමාණ ඉහළ නැංවීම සඳහා කටයුතු කළ යුතුය.

ආරක්ෂිත ගෘහ තුළ එළවළු නිෂ්පාදනකරුවන් වර්තමානයේ මුහුණ දෙන විවිධ ගැටලු විසඳීමටත් ඔවුන්ගේ නිෂ්පාදන අපනයනය ඉලක්ක කර ගත් කර්මාන්ත බවට පරිවර්තනය කිරීමටත් පියවර ගත යුතුය. ආරක්ෂිත ගෘහ තුළ බෝග වගාව ප්‍රචලිත කිරීම සඳහා ආරක්ෂිත ගෘහ ගොඩනැගීමට අවශ්‍ය සහනාධාර ලබාදීමට අමතරව පළිබෝධ නාශක භාවිතය අවම කිරීම, දියුණු තාක්ෂණය භාවිතය හා සුවිශේෂී අපනයන වෙළෙඳපොළ පහසුකම් සපයා ගැනීම සම්බන්ධයෙන් ගොවීන්ගේ දැනුම හා කුසලතා වර්ධනය කිරීම අත්‍යවශ්‍ය වේ.

ගුණාත්මක, ප්‍රමාණාත්මක හා කාලීන සැපයුම සහතික කරමින් වෙළඳපොළ ඉලක්ක ගත අඛණ්ඩ නිෂ්පාදන-සැපයුම්-අපනයන අගයදාමයන් ඔස්සේ ක්‍රියාත්මක වීම සඳහා එළවළු නිෂ්පාදකයන් වෙතින් උසස් ප්‍රමිතියෙන් යුතු නිෂ්පාදන ලබා ගැනීමට කෘෂිකර්ම දෙපාර්තමේන්තුව වඩා වැඩි අවධානයක් යොමු කළ යුතුය. මේ සඳහා නිරතුරු නව තාක්ෂණ උපදෙස් ලබාදීම අවශ්‍ය වේ. හරිතාගාර වගාවේ දී කාර්යක්ෂම ජල සම්පාදන ක්‍රම භාවිතය හා හරිතාගාර ගොඩනැඟීම හා නඩත්තුව, පළිබෝධනාශක භාවිතය අවම කරමින් ගුණාත්මක එළවළු නිපදවීම, අපනයනය සඳහා එළවළු තේරීමේ ප්‍රමිතීන් යන කරුණු ආශ්‍රිතව පුහුණු වැඩසටහන් අත්‍යවශ්‍ය වේ. උසස් ප්‍රමිතියෙන් යුතු හරිතාගාර බෝග බීජ සපයා ගැනීම හරිතාගාර ගොවීන්ට සැලකිය යුතු මට්ටමින් බලපා ඇත. එබැවින් එම ගැටලු විසඳීම සඳහා බීජ හා රෝපණ ද්‍රව්‍ය සංවර්ධන මධ්‍යස්ථානය හා බීජ සහතික කිරීමේ සේවාවේ අවධානය යොමු කිරීම අවශ්‍ය වේ. එළවළු අපනයන අගයදාමය තුළ නිෂ්පාදකයන් හා සැපයුම්කරුවන් මුහුණපාන ඇණවුම් පිළිබඳ අවිනිශ්චිතතා අවම කිරීම සඳහා එළවළු එකතු කර අපනයනකරුවන් වෙත සපයන පුද්ගලයන් හට ශීතාගාර පහසුකම් හා ණය සහන ලබාදී එළවළු ගබඩා කර තබා අවශ්‍ය වේලාවට ඇණවුම් ඉදිරිපත් කිරීමට මං සැලසිය යුතුය.